**ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශිර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබීම.<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.1.1<br><br>2.5 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවල දී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද, සම්පූර්ණයෙන්ම ද, අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට ද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමට ද, ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා | 1. කළමනාකරණ දුර්වලතා<br>2. මහජනයා වෙත සේවා ඉටුකිරීමේ දුර්වලතා | 2.3<br><br>2.4 |

| | | | |
|---|---|---|---|
| | අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.6 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2. 1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර තිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත අරමුදලක් වන වකුෆ් අරමුදලේ හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන හජ් අරමුදල සඳහා ක්‍රියාකාරි සැලසුම් පිළියෙල කර නොතිබුණි.

### 2.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ඉන්ධන දහනයවීම් පරික්ෂා නොකිරීම**

රජයේ වාහන නඩත්තු කිරීම සම්බන්ධව 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය ප්‍රකාර සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසුව මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000 ක් දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා එපරිදි ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. එම ඉඩම දෙපාර්තමේන්තුව නමට පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 කළමනාකරණ දුර්වලතා

**අරමුදල් පවත්වා ගැනීම**

**(අ) මුස්ලිම් පුන්‍යාධාර අරමුදල**

(i) ලියාපදිංචි මුස්ලිම් දේවස්ථානයක, පුන්‍ය භාරයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 6 ක ප්‍රමාණයක්ද , මුස්ලිම් සිද්ධස්ථානයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 10 ක්ද මුස්ලිම් පුන්‍යාධාර අරමුදලට ලබා දිය යුතු බව වකුෆ් පනතේ 4 වන පරිච්ඡේදයේ 43 (2) වගන්තිය යටතේ දක්වා ඇත. එහෙත් අදාළ පල්ලි හා සිද්ධස්ථාන වෙතින් ලැබිය යුතු නියම මුදල මුස්ලිම් පුන්‍යාධාර අරමුදලට ලැබේදැයි පරීක්ෂා කිරීමට සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබිණි.

(ii) 2017 වර්ෂය තුළ මුස්ලිම් පුනායාධාර අරමුදල සඳහා රු.3,081,771 ක මුදලක් ලැබී තිබුණද පනතේ සඳහන් අරමුණු ඉටු කිරීමට අදාළව කිසිදු වියදමක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(iii) 2006 දෙසැම්බර් 22 දිනැති PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය පරිදි ව්‍යවස්ථාපිත හා භාර අරමුදල් සඳහා අරමුදලේ අරමුණුවලට අනුකූලව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර ඒ අනුව වියදම් දැරිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) හජ් අරමුදල**

---------------

(i) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වසා දැමීමට හෝ තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කළ යුතු වුවත් මෙම අරමුදල සඳහා මෙතෙක් නීතිමය පදනමක් ලැබී නොතිබිණි.

(ii) ඉහත (i) හි සඳහන් චක්‍රලේඛයේ 4.2. (ඊ) හි පරිදි, නිවැරදි පොත් පත් සහ ලේඛන නඩත්තු කරමින් සතුටුදායක ගිණුම් ක්‍රමයක් පවත්වාගෙන යා යුතු බව දක්වා ඇත. ඒ අනුව හජ් අරමුදල සඳහා පවත්වාගෙන ඇති ලෙජර් ගිණුම් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**(ඇ) අරමුදල්වල වාර්ෂික කාර්යසාධන වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන**

------------------------------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත ඒ ඒ අරමුදල් පිළිබඳව වාර්ෂික ගිණුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වකුෆ් අරමුදල හා හජ් අරමුදල සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි.

**2.4 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

------ ---------------------------

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව සියළුම රාජ්‍ය ආයතනවල පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. එහෙත් දෙපාර්තමේන්තුව විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

----------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| --------- | -------------- | ------------ | ------------- | ----------- | -------------- |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 58.620 | 55.949 | 2.671 | 4.55 |
| | මූලධන | 122.300 | 120.335 | 1.965 | 1.61 |
| | **එකතුව** | **180.920** | **176.284** | **4.636** | **2.56** |
| 2014 | පුනරාවර්තන | 60.640 | 55.351 | 5.289 | 8.72 |
| | මූලධන | 31.050 | 22.405 | 8.645 | 27.84 |
| | **එකතුව** | **91.690** | **77.756** | **13.934** | **15.19** |
| 2015 | පුනරාවර්තන | 82.304 | 81.845 | 0.459 | 0.55 |
| | මූලධන | 76.251 | 75.341 | 0.910 | 1.19 |
| | **එකතුව** | **158.555** | **157.186** | **1.369** | **0.86** |
| 2016 | පුනරාවර්තන | 106.717 | 97.124 | 9.593 | 8.98 |
| | මූලධන | 31.880 | 30.350 | 1.530 | 4.80 |
| | **එකතුව** | **138.597** | **127.474** | **11.123** | **8.02** |
| 2017 | පුනරාවර්තන | 109.085 | 93.919 | 15.165 | 13.90 |
| | මූලධන | 37.200 | 33.617 | 3.582 | 9.63 |
| | **එකතුව** | **146.285** | **127.536** | **18.748** | **12.81** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.මිලියන 16.311 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 24.038 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.50 | 3.66 | 1.25 | 1.89 | 12.00 | 8.45 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 215,752 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 21 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණු අතර ඒවා අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ) සමාලෝචිත වර්ෂය තුළ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම**

2016 දෙසැම්බර් 28 දිනැති අංක 31/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි 2017 වර්ෂයේදී විශේෂ අත්තිකාරම් ලබාදිය යුත්තේ 2017 ජනවාරි 01 සිට 2017 පෙබරවාරි 28 දින දක්වා පමණක් වන අතර එම අත්තිකාරම් 2017 වර්ෂය තුළදී නිරවුල් කළ යුතුය. එහෙත් ගිණුම් වලින් මගහැරීම නිසා පැනනැගි රු.4,000 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් 2017 දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය විය.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 44.585 ක් වැය කර තිබුණි. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල වියදම රු.500,955 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 03 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 95 | 72 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 14 | 03 |
| | එකතුව | 123 | 89 | 34 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 34 ක් පැවතුණද එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අවශ්‍ය පරිදි අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට හෝ පියවරගෙන නොතිබුණි.